# ස්ත්‍රී පුරුෂ සමාජභාවය තුළ පුරුෂයන්ට එරෙහි ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සඳහා බලපානු ලබන සාධක පිළිබඳ අධ්‍යයනයක්

# A Study on the Factors Affecting to the Domestic Violence Against Men in a Gender Based Perspective

**සඳරුවන් කේ. ඩී. එම්[1], ආචාර්ය විජේවර්ධන බී. වී. එන්[2], ප්‍රේමරත්න එල්. ඩී. එම්[3]**

[1,2]අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
[3]ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
mishankahawala@gmail.com[1],neranji@sjp.ac.lk[2], rajapelapatha.prem@gmail.com[3]

**සාරාංශය**

මානව සමාජයේ පැවැත්ම තහවුරු කරන ප්‍රධානත ම සාධකයක් වූ පවුල නැමැති, සමාජයේ මූලික තැනුම් ඒකකයේ සමාජිකයෝ අන්‍යෝන්‍ය වශයෙන් එකම ඒකකයකට වී කටයුතු කළ ද ඔවුනොවුන් තුළ හට ගනු ලබන මනෝ කායික හේතු සාධක මත ප්‍රචණ්ඩත්වය එකිනෙකාට යොමු කරනු ලබති. අද්‍යතනයේ එලෙස ගෘහයක් තුළ ඇති වන ප්‍රචණ්ඩත්වය කාන්තාවන්ට වැඩි වශයෙන් සිදුවන බවට අවධානය යොමු වී තිබුණ ද ඊට සමානවම පුරුෂයන් ද ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට පත්වන වේ. තුන් වන ලෝකයේ රටක් වන ශ්‍රී ලංකාව තුළ මෙවැනි තත්ත්වයක් පැවතිය ද එය නිලීනව පවතින හෙයින් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම කාලීන අවශ්‍යතාවයකි. සමාජය තුළ කතිකාවකට බඳුන් නොවී පවතින මෙම පුරුෂයන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සඳහා බලපානු ලබන හේතු සාධක මොනවාද, එම ප්‍රචණ්ඩත්වයේ ස්වභාවය කෙබඳු ද යන්න මෙම පර්යේෂණයේ දී අවධානය යොමු කරන ලදි. එම අධ්‍යයනය සිදුකිරීමේ දී මූලාශ්‍ර පරිශීලනය, ක්ෂේත්‍ර අධ්‍යයනය හා වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම සේවා වසම් 60න් ග්‍රාම නිලධාරි වසම් දෙකක් අහඹු ලෙස තෝරාගෙන එම වසම් දෙකෙන් පවුල් 60 ක් විනිශ්චය සඳහා වූ නියදුම් ක්‍රමය යටතේ තෝරා ගෙන විවාහක පුරුෂයන් 60කින් යුත් නියදිය තෝරා ගෙන සිදු කරන ලද මෙම පර්යේෂණයේ දී පුරුෂයන් 77% ක් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට පත් වන බව හෙළි වූ අතර ඉන් වැඩි පිරිසක් තම බිරිඳගෙන් ප්‍රචණ්ඩත්වයට පත් වන්නන් ය. කායික හිංසනය වඩා මානසික හිංසනයට පත් වන අතර එය 87%ක ප්‍රතිශතයක් බව අනාවරණය විය. පුරුෂයන්ගේ මත් ද්‍රව්‍ය භාවිතය සහ පවුලේ පවතින ආර්ථික ගැටළු ප්‍රධාන වශයෙන් මෙම තත්ත්වයට ගොදුරු වීමට බලපෑ හේතු සාධක ලෙස පර්යේෂණයෙන් අනාවරණය විය. මෙම පර්යේෂණය අනාගතයේ දී ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් නෛතික ප්‍රතිපත්ති සම්පාදනයේ දී පුරුෂයන්ට සිදු වන ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමට උපයුක්ත කර ගත හැකි ය.

**ප්‍රමුඛ පද ඃ ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ප්‍රචණ්ඩත්වය, පුරුෂාධිපත්‍ය, හිංසනය, මත් ද්‍රව්‍ය**

## 1. හැඳින්වීම

ස්ත්‍රී පුරුෂ සමාජභාවය වූ කලී ජීව විද්‍යාත්මක තත්ත්වයක් නොවන අතර, සමාජය තුළ පුරුෂයන්ට වෙනම ම කාර්යභාරයක් ද, ස්ත්‍රියට වෙනම ම කාර්යභාරයක් ද සමාජානුයෝජනය හරහා හිමි වීම යි. විවාහය නමැති සමාජය මගින් නෛතික වශයෙන් පිළිගනු ලබන බැඳීමෙන් ගොඩනැගෙන පවුලක් තුළ ස්ත්‍රිය හා පුරුෂයා අන්‍යෝන්‍ය වශයෙන් කටයුතු කරයි. සාම්ප්‍රදායික සමාජ ක්‍රමවල සිට නූතන සංකීර්ණ සමාජ දක්වා සමාජය වෙනස් වීමට පටන් ගැන්මත් සමග ම එම අතීත සාම්ප්‍රදායික සමාජ ක්‍රමය තුළ දක්නට ලැබුණු බොහෝමයක් ක්‍රමවේදයන් වෙනස් වීමට බඳුන් විය. පවුල් සංස්ථාව එහි දී විස්තාරික පවුල් ක්‍රමයේ සිට න්‍යෂ්ටික පවුල් ක්‍රමය දක්වා වෙනස් විය. එම සමාජවල විස්තෘත හා න්‍යෂ්ටික පවුල් යන දෙකම දක්නට ලැබුණ ද විස්තෘත පවුල් වැඩි වශයෙන්



ISBN 978-955-627-120-1

ව්‍යාප්තව පැවතුනි. මව, පියා, ආච්චි, සීයා, නැන්දා, මාමා, දූ දරුවන් ආදී වශයෙන් පවුලක සමාජිකයන් වැඩි විය. ඒ තුළ පවුලේ සාමාජිකයන් අතර අන්‍යෝන්‍ය සුහදතාවය, ආරක්ෂාව යනාදිය තහවුරු විය. එම පවුල් ක්‍රමය තුළ ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව අවම තත්ත්වයක පැවතිනි. නූතන සංකීර්ණ සමාජ ක්‍රමය දක්වා සමාජ විකාශනය සිදුවත්ම න්‍යෂ්ටික පවුල් ක්‍රමය වැඩි වශයෙන් ව්‍යාප්ත විය. එහි දී මව, පියා, දූ දරුවන් පමණක් එකට වාසය කිරීම තුළ පවුල අභ්‍යන්තරයේ පවත්නා අන්‍යෝන්‍ය සහයෝගීතාව අවම වීම, දූ දරුවන්ගේ ආරක්ෂාව අවම වීම මත පවුල්හි කාන්තාවන්ට එරෙහිව පුරුෂයනුත්, පුරුෂයන්ට එරෙහිව කාන්තාවනුත් වශයෙන් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයක් ඇති විය. සමාජය තුළ කාන්තාවන්ට එරෙහිව ගෘහස්ත ප්‍රචණ්ඩත්වයක් සිදු වනවා යැයි සමාජය තුළ කතිකාවට බඳුන් වී තිබෙන නමුත්, සමාජය තුළ පුරුෂයන්ට එරෙහි ගෘහස්ත ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් නිලීන තත්ත්වයක්ව පවතී. පුරුෂාධිපත්‍යක් පවතින සමාජවල මෙවැනි තත්ත්වයන් සමාජගත වීම අවම වශයෙන් සිදු වේ. කාන්තාව උපතින්ම මෘදු, මොළොක් තැනැත්තියක් වන අතර, පුරුෂයා රළු, ප්‍රචණ්ඩකාරී ගතිවලින් යුක්ත වන නමුත් ගෘහස්ථයන්හි හෝ ඉන් බාහිර සමාජයන්හි ප්‍රචණ්ඩත්වයට පත් වීම උදෙසා කවර සාධක බලපාන්නේ දැයි අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාව හරහා සිදු කර ඇත.

### 1. 1. පර්යේෂණ ගැටළුව

අද්‍යතනයේ දී කාන්තාවන්ට එරෙහිව ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කාන්තාවාදීන් මෙන්ම කාන්තා සංවිධාන ද හඬ නැගුව ද ඒ හා තරමටම ගෘහයන් තුළ පුරුෂයන් ද හිංසනයට පාත්‍ර වේ. නමුත් පවත්නා සංස්කෘතිකමය සීමා මායිම් මත පදනම්වත්, එවන් තත්ත්වයකට පුරුෂයා පත් වීම ඔහු දුර්වල අයෙකු ශක්තමත් නොවන්නෙකු යනුවෙන් හැඳින්වේ යැයි ඇති මැලිකම හේතුවෙන් එය නීතිය ඉදිරියට හෝ සමාජයේ වැඩි අවධානයකට ලක් නොකරනු ඇත. ස්ත්‍රී පුරුෂ සමාජභාවය තුළ කාන්තාවන්ට පවතන්නා ප්‍රචණ්ඩත්වය පිළිබඳව වැඩි අවධානයක් යොමු කෙරුන ද ඊට සාපේක්ෂව පුරුෂයන්ට තම නිවසේ දී හිංසනය සිදු වීමේ ස්වභාවය සම්බන්ධයෙන් සමාජයේ අවධානය යොමු නො වීමත්, ඒවා වාර්තා වීම හෝ නොවීම කෙරෙහි බලපානු ලබන සාධක කෙරෙහිත්, එම පුරුෂයන්ට එරෙහිව පවතින ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයේ නෛතික තත්ත්වය අධ්‍යයනය කිරීම කාලීන අවශ්‍යතාවයක් වේ.

### 1. 2. පර්යේෂණයේ වැදගත්කම

සමාජය තුළ ප්‍රධාන වශයෙන් අවධානයට ලක් වී නොතිබෙන, නමුත් සමාජය තුළ සිදු වන පුරුෂයන්ට එරෙහි ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳව අධ්‍යයනය කිරීම කාලීන අවශ්‍යතාවයක්ව පවතිනුයේ, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳව පවත්නා නෛතික ප්‍රතිපාදන සම්බන්ධයෙන් පුරුෂයන්ගේ දැනුම පිළිබඳ අවබෝධයක් ලබා ගෙන, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් නීති සහ ප්‍රතිපත්ති සම්පාදනයේ දී ඒ සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කිරීමට කටයුතු කිරීම.

### 1. 3. පර්යේෂණයේ අරමුණු

#### 1. 3. 1. ප්‍රධාන අරමුණ

- පුරුෂයන්ට එරෙහිව සිදු වන ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය කෙරෙහි බලපාන හේතු සාධක මොනවාද යන්න අධ්‍යයනය කිරීම.



ISBN 978-955-627-120-1

### 1. 3. 2. උප අරමුණු

- පුරුෂයන්ට වන ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයේ ස්වභාවය අධ්‍යයනය කිරීම.
- පුරුෂයන්ට වන ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වාර්තා නොවීමට බලපාන හේතු සොයා බැලීම.
- ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් පවත්නා නෛතික තත්ත්වය පිළිබඳව සොයා බැලීම.

## 2. ක්‍රමවේදය

### 2. 1. අධ්‍යයන ප්‍රදේශය හා නියදිය

කළුතර දිස්ත්‍රික්කයේ, වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් 850 a පැලවත්ත බටහිර උතුර සහ 850 පැලවත්ත යන ග්‍රාම නිලධාරී වසම් දෙක අධ්‍යයන ප්‍රදේශය වශයෙන් අහඹු ලෙස තෝරා ගැනුණි.

### 2. 2. නියදිය


තෝරා ගත් ග්‍රාම නිලධාරී වසම් දෙකෙන් විනිශ්චය සඳහා වන නියදුම් ක්‍රමය යටතේ, එක් ග්‍රාම නිලධාරී වසමකින් විවාහක පුරුෂයන් 30ක් වන සේ සමස්ත නියදිය ලෙස විවාහක පුරුෂයන් 60ක් තෝරා ගැනුණි.

### දත්ත රැස් කිරීම

ප්‍රධාන වශයෙන් දත්ත රැස් කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණ උපලේඛනයක් භාවිත කළ අතර, ඊට අමතරව පසුබිම් සිද්ධි අධ්‍යයනය, නිරීක්ෂණය ආදී ක්‍රම මගින් දත්ත රැස් කරන ලදි.

### 2. 3. දත්ත විශ්ලේෂණය

රැස් කර ගත් දත්ත විශ්ලේෂණය කිරීම සඳහා ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය සහ ගුණාත්මක දත්ත විශ්ලේෂණය මත සිදු කරන ලදි.





*ප්‍රස්තාර අංක 1, ගෘහස්ත ප්‍රචණ්ඩත්ත්වයට පත් වීම සම්බන්ධ තොරතුරු*

දත්තදායකයන්ගේ කුටුම්භයන් තුළ ප්‍රචණ්ඩත්ත්වයට පත්වන්නේ තම බිරිඳගෙන්, අම්මාගෙන්, සහෝදර සහෝදරියන්ගෙන්, නැන්දම්මාගෙන් හෝ වෙනත් සමීප පවුලේ ඥාතියෙකුගෙන් ය. එහි දී සමස්ත නියදියට අයත් දත්තදායක පිරිසෙයින් පීඩාවට පත් නො වන පිරිසට වඩා පීඩාවට පත් වන පිරිස බහුතරය වේ. සමස්ත නියදියෙන් 23 දෙනෙකු සංඛ්‍යාත්මක ලෙස ප්‍රචණ්ඩත්ත්වයට පත්




ISBN 978-955-627-120-1

වී ඇති අතර එය ප්‍රතිශතයක් ලෙස 77% කි. ප්‍රචණ්ඩත්ත්වයට පත් වූවන් අවම අගයක් වන අතර එය සංඛ්‍යාත්මකව 07 ද ප්‍රතිශතයක් ලෙස 23% ද වේ. සමාජය තුළ හෙළි නො වී නිලීනව පවත්නා මෙම ප්‍රචණ්ඩත්ත්වය හෙළි නොවී පවත්නා නමුත් එම ප්‍රචණ්ඩත්ත්වය සමාජගත වී තිබෙන බව මෙම පර්යේෂණවලින් පැහැදිලි වේ.




*ප්‍රස්තාර අංක 2, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සිදු කරන පාර්ශව*

නියදියට අදාළව ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට පත් වන පුරුෂයන් 77% හා 60% ප්‍රමාණයක් එකී ප්‍රචණ්ඩත්වයට පත්වන්නේ කාගෙන්දැයි සොයා බැලීමට වැදගත් විය. එයින් බහුතරයක් පිරිස ප්‍රචණ්ඩත්වයට පත් වන්නේ තම බිරිඳ අතින් බවට ලැබු දත්ත සාක්ෂි වේ. සංඛ්‍යාත්මක වශයෙන් එය 18 දෙනෙකු වන අතර ප්‍රතිශතයක් ලෙස 78%ක් පමණ වේ. ඥාතීන් අයත් ප්‍රචණ්ඩත්වයට පත් වන පුරුෂයන් ද 09% ප්‍රතිශතයක් වන අතර නැන්දම්මාගෙන් ප්‍රචණඩත්වයට පත් වන බව පැහැදිලි ය. මෙම ප්‍රචණ්ඩකාරී තත්ත්වය වැඩි වශයෙන් දැකිය හැකි වන්නේ බින්න විවාහ ක්‍රමය මගින් විවාහ වූ විස්තෘත පවුල්වල බව හඳුනාගත හැකි ය. එය සංඛ්‍යාත්මකව 03 වන අතර 13% ප්‍රතිශතයක් වේ. ගෘහස්ථ කුටුම්බයන් තුළ ප්‍රචණ්ඩත්වයට පත් වන පුරුෂයන් විවිධ තැනැත්තන්ගෙන් ප්‍රචණ්ඩත්වයට පත් වන අතර, පුරුෂයන් තම බිරිඳගෙන් වැඩි වශයෙන් ප්‍රචණ්ඩත්වයට පත් වන බවට අධ්‍යයනයේ දී හඳුනාගත හැකි වූ ප්‍රධානත ම කැපී පෙනෙන ලක්ෂණයකි.




*ප්‍රස්තාර අංක 3, ප්‍රචණ්ඩත්වය සඳහා බලපාන සාධක*




ISBN 978-955-627-128-1

සමස්ත දත්තදායකයන් කෙරෙහි අවධානය යොමු කිරීමේ දී වැඩි වශයෙන් ප්‍රචණ්ඩත්වයට ගොදුරු වී තිබෙන්නේ ස්වාමියා මත් පැන් පානය කර සිටින විට දී එය විශේෂ කොට දැකිය හැකි ය. එය නියැදියට අදාළව බලන කල 21%ක පමණ ප්‍රතිශතයක අගයක් ගනී. මෙම ප්‍රචණ්ඩත්වය කෙරෙහි බලපාන සාධක අතර පවුලේ ආර්ථික ප්‍රශ්න ද හේතු වී තිබෙන අතර එය 19% ප්‍රතිශතයක් ගනී. එය බොහෝ දුරට බීමත්කමට සාපේක්ෂ ලෙස ඒ හා සමාන ම ප්‍රතිශතයක් වන අතර බීමත්කම යන සාධකය නිසාම ද ආර්ථික ගැටලු මතු වී තිබෙන අවස්ථා ද තිබේ. නමුත් ස්වාමියාගේ බීමත්කම යන සාධකය ඇති වීමට තම කලත්‍රයා වන බිරිඳගේ බලපෑම ඇති වී තිබෙන අවස්ථා නියැදිය තුළ දැක ගැනීමට හැකි වේ. එනම් තම කලත්‍රයා ප්‍රකෝප කිරීමේ හේතුව මත මෙවැනි හිංසාකාරී තත්ත්වයන් හේතු වේ. දෙදෙනා අතර පවත්නා අන්‍යොන්‍ය සැකය හේතුවෙන් ද ප්‍රචණ්ඩකාරීත්වයන් උද්ගත වේ. බිරිඳගේ ඉල්ලීම්වලට එකඟ නොවන අවස්ථාවන්වල දී ද 11% හිංසනයට පත් වන බව නිරූපණය වෙයි. එහි දී බොහෝ දත්තදායකයන් ස්ත්‍රී ආධිපත්‍ය ඉස්මතු වූ අවස්ථාවන්වලදී (බිරිඳගේ ඉල්ලීම් දැඩි වූ අවස්ථාවන් වලදී) ද මෙලෙස ප්‍රචණ්ඩත්වයට පත් වී තිබෙන බව දැක ගත හැකි වේ. ස්ත්‍රියගේ නූගත්කම, දූ දරුවන්ගේ වගකීම්වල වැඩි කොටසක් බිරිඳ විසින් ඉසිලීම, විලාසිතා සඳහා වැඩි වශයෙන් යොමු වූ කාන්තාවන් ආදී සාධකවලට මුහුණ දී තිබෙන ස්වාමිපුරුෂයන් මෙලෙස ප්‍රචණ්ඩත්වයට පත් වී තිබේ. එමෙන් ම බිරිඳගේ සිතෙහි තම කලත්‍රයා වන පුරුෂයා කෙරෙහි සැක පවතින විට දී ද පුරුෂයාට එරෙහිව ප්‍රචණ්ඩත්වය සිදු වූ අවස්ථා ඇති අතර, සමස්ත නියැදිය පුරාවටම එය 11% පමණ වූ ප්‍රතිශතයක් ද ගනී. එම තත්ත්වය ද බොහෝ දුරට දත්තදායකයන්ගේ නිවස්වල බිරිඳගේ හැසිරීම මේ සඳහා බලපා තිබේ. බොහෝ දුරට කුලී සේවයේ යෙදෙන ස්වාමියන් මෙන් ම ආයතනික වශයෙන් සේවයේ නිරත ස්වාමියන් කෙරෙහි ද මෙලෙස සැකය ඇති කර ගැනීමට බිරින්දෑවරුන් පෙළඹී තිබේ. කුලී පදනම මත කොන්ත්‍රාත් සඳහා ස්වාමියන් දුර බැහැර ප්‍රදේශවලට සේවය සඳහා ගිය පසු ද මෙකී තත්ත්වය එම පවුල්වල බිරින්දෑවරුන්ගේ සිත්හි හටගන්නා සැකය නිසා මෙකී කලත්‍රයන් වන පුරුෂයන් ප්‍රචණ්ඩත්වයට පත් වී තිබෙන බව ද සාධක වේ. ප්‍රදේශයේ සිටින අනෙකුත් පවුල්වල ජීවත් වන පුරුෂයන් සමඟ සිය සැමියා සංසන්දනය කරන්නට යාම ද මෙම සැකය යන සාධකය වර්ධනය වීමට බලපා තිබේ. විශේෂයෙන් ම බිරිඳගේ පවතින සැක කටයුතු ස්වභාවයන් සහ බිරිඳගේ අනියම් සබඳතාවයන් නිසා ද කලත්‍රයා වන පුරුෂයාගේ සිතෙහි හටගන්නා සැකයත් සමඟ වන නොසන්සුන් තත්ත්වය නිසා ද මෙම ප්‍රචණ්ඩකාරී තත්ත්වයන් ඇති වී තිබේ. මෙලෙස ස්වාමියාග් සිතෙහි ඇති වන සැකය තවත් වර්ධනය කරලීමට බිරිඳගේ හැසිරීම් රටාව මෙන්ම බිරිඳගේ ක්‍රියාකලාපය බොහෝ දුරා මෙහි දී හේතු සාධක වී තිබේ. බිරිඳ භාවිතා කරනු ලබන ජංගම දුරකතනය, බිරිඳ අඳින පළඳින ආකාරය, බිරිඳගේ මෙන් ම බිරිඳගේ පවුලේ අයගේ (විස්තෘත පවුල් වල) හැසිරීම යන සාධක ද මෙම දත්තදායක පවුල්වල ස්වාමියන් ප්‍රචණ්ඩත්වයට පත් කිරීම කෙරෙහි බෙහෙවින් හේතු සාධක වී තිබෙන බව ගම්‍ය වේ. මේ ආකාරයේ තත්ත්වයන් මෙන් ම බිරිඳගේ පවතින යම් යම් අනියම් ඇසුරු නිසා ද ස්වාමියා ප්‍රචණ්ඩත්වයට පත් වීම සිදු වී තිබෙන



ISBN 978-955-627-128-1

අතර එහිදී බිරිඳගේ එකී අනියම් සබඳතා සමඟ බැඳී පවතින සාධක සියල්ල ඒ කෙරෙහි හේතු සාධක වී තිබේ. පුරුෂයාගේ තිබෙන යම් යම් වැරදි සහගත හැසිරීම් සහ ක්‍රියාකලාපයන් නිසා ද බිරිඳ ඊට දක්වන ප්‍රතිචාරයන් හමුවේ ද පුරුෂයා ප්‍රචණ්ඩත්වයට පත් වන අවස්ථා දැක ගත හැකි විය. එහි දී උක්ත දක්වන ලද සාධක ද යම් අවස්ථාවන්වලදී හේතු සාධක වී තිබෙන බව දැක ගත වේ.




*ප්‍රස්තාර අංක 4. ප්‍රචණ්ඩත්වය සිදු කරන ආකාරය*

පුරුෂාධිපත්‍ය රජයන ලාංකේය සමාජ සංස්ථාව තුළ කාන්තාවෝ පුරුෂයා ඉක්මවා යාමට ද කෙසේ නමුත් බියක් දක්වති. එම නිසා කායික හිංසනයට ලක් වීමට වඩා මානසික හිංසනයට පත් වීම වැඩි වශයෙන් සිදු වන බව මෙම නියදිය තුළින් වඩාත් පැහැදිලි විය. එය මෙම ග්‍රාමීය සමාජය තුළ 87% ප්‍රතිශතයක් ලෙස හඳුනාගැනීමට හැකි වේ. එය සංවිධානාත්මක ලෙස විසි එක් දෙනෙකු බව හඳුනාගත හැකි ය. එය මානසික පීඩනයේ ප්‍රභේදයන් වන බැන වැදීම, තර්ජනය කිරීම හා නොසලකා හැරීම යන ඒවා වෙන් වෙන් වශයෙන් කොපමණ සංඛ්‍යාවක් වන්නේදැයි ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය මඟින් හඳුනාගත හැකි ය. ග්‍රාමීය සමාජය තුළ බැන වැදීම මඟින් ප්‍රචණ්ඩත්වය සිදු වී තිබෙන ප්‍රතිශතය කෙරෙහි අවධානය යොමු කිරීමේ දී එය 50% ඉක්මවූ 61% පමණ ප්‍රතිශතයක අගයක් ගන්නා බව අධ්‍යයනයෙන් පැහැදිලි වේ. ඒ අනුව බැන වැදීම බහුල වශයෙන් දැකගත හැකි සාධකයක් වන අතර එය දත්තදායකයන් සියලු දෙනාට ම පොදු වී තිබෙන සාධකයක් බවට ද හඳුනාගත හැකි ය. එය දත්තදායක පවුල් සියල්ලෙහිම සාමාන්‍ය තත්ත්වනක් ලෙස හඳුනා ගැනීමට ද හැකි ය. මෙවන් තත්ත්වයක් ඉක්මවා ගිය කල පහරදීම වැනි තත්ත්වයන් ඇති වීම ද දැක ගත හැකි ය. සාමාන්‍ය ලෙස සළකා බලන කල එය 13% ප්‍රතිශතයක අගයක් ගනී. මෙම ප්‍රතිශතයට අදාළ දත්තදායකයන් බොහෝ දුරට බැන වැදීම ඉක්මවාගිය තැන පහරදීම යන සාධකයට එළඹී තිබෙන බව වැඩි දුරටත් අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි වේ. එය බොහෝ දුරට ප්‍රචණ්ඩත්වය ඉක්මවා ගිය අවස්ථාවක් වන අතර එහි දී ස්වාමියා (පුරුෂයා) ප්‍රබල ලෙස ප්‍රචණ්ඩත්වයට ලක් වී තිබෙන බව ගම්‍ය වේ.

ගෘහස්ථ කුටුම්භයන් තුළ සිදු වන මෙම ප්‍රචණ්ඩ ක්‍රියා කෙරෙහි අවධානය යොමු කිරීමේ දී නොසළකා හැරීම යන සාධකය නිසා ද ස්වාමියන් ප්‍රචණ්ඩත්වයට පත් වී තිබෙන බව ගම්‍ය වේ. එය 17% ප්‍රතිශතයක් ලෙස නියදිය තුළ දැක ගත හැකි වේ. විශේෂ ලෙස ම මෙම සාධකය දැක ගත හැකි වන්නේ යම් තාක් හෝ උගත්කම සහිත ගෘහස්ථ කුටුම්භයන්වල පමණක් වන අතර උගත්කම අඩු එහෙත් අන්දැකීම් අතින් පිරිපුන් කුටුම්භයන් තුළ ද මෙම ලක්ෂණය දැක ගත හැකි වේ. උක්ත දක්වන ලද සාධකවලට අමතර ලෙස තර්ජනය කිරීම නිසා ද ප්‍රචණ්ඩත්වය සිදු වන



ISBN 978-955-627-120-1

බවට සාධක අනාවරණය වූ අවස්ථා වන අතර එය සමස්ත නියදියට ම අදාළ ලෙස 09% තරම් සුළුතර ප්‍රතිශතයක් බව පෙන්වාදිය හැකි ය.

මේ අනුව එම මානසික පීඩන තත්ත්වයන්වල දී ක්ෂණිකව ම කාන්තාවන් කෝපයට පත් වීම හේතුවෙන් පරිභව කිරීම සිදු කරන අතර ම, දිගු කාලීන වශයෙන් සිදු කරනු ලබන පීඩාවන් අවම වේ. කාන්තාවන්ගේ ස්වභාවය ඉක්මනින් හැගුම්බර වීම වන නිසා මෙලෙස පුරුෂයන්ට මානසික වශයෙන් සිදු වන පීඩා කිරීම් ඉහළ මට්ටමකින් වන බව පැහැදිලි ය. එය පීඩා කිරීමේ ස්වභාවය මැනවින් නිරූපණය කරන්නකි.

**3. නිගමන**

පුරුෂයන්ට එරෙහි ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට පත් වීම කෙරෙහි බලපාතු ලබන සාධක කීපයක් හඳුනා ගත හැකි වූ අතර, එකී සාධක වශයෙන් නිවසේ පවත්වනා ආර්ථික දුෂ්කරතාවන්, දරුවන්ගේ ප්‍රශ්න තිබීම, බිරිඳගේ අනියම් සබඳතා තිබීම, පුරුෂයා විසින් කාන්තාව ප්‍රකෝප කරවන සුළු වැරදිවල නිරත වීම, පුරුෂයා කෙරෙහි කාන්තාවගේ පවත්නා සැකය යනාදිය හඳුනා ගත හැකි වූ අතර බීමත්කම ප්‍රධානතම සාධකයක් ලෙස හඳුනා ගැනුණි. සියලුම ශාරීරික මානසික වශයෙන් සිදු කරන පහර දීම්, තුවාල කිරීම්, බලහත්කාරකම් කිරීම්, තර්ජනය කිරීම් හා අවමානාත්මක වචනවලින් බැන වැදීම් යනාදී කරුණු ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය එල්ල පුරුෂයා වෙත මුදාහරින ක්‍රම වශයෙන් අනාවරණය කර ගත හැකි විණි. ප්‍රධාන වශයෙන් ම තම බිරිඳගෙන් පුරුෂයන් ප්‍රචණ්ඩත්වයට පත් වන බවට හඳුනා ගැනුණු අතර, බීමත්කම නැමැති සාධකය ඒ සඳහා බලපා තිබෙන බව ද ප්‍රත්‍යක්ෂ වූ අතර, තව දුරටත් එම නිගමනයන් පහත පරිදි කැටිකොට දැක්වීමට පුළුවන.

- සමාජය තුළ ස්ත්‍රීන්ට මෙන්ම පුරුෂයන්ට ද ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයක් සිදු වන බව නිගමනය විය.
- සත්‍රීන් මෙන් නොව පුරුෂයන් තමන්ට සිදු වන ප්‍රචණ්ඩත්වය සමාජය තුළ කතා බහට ලක් නොකරයි.
- පුරුෂයන්ට ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව නීතිය යටතේ ප්‍රතිපාදන සලසා තිබෙන බවට අවබෝධයක් නොමැතිකම නිසා ඔවුහු නීතියේ පිහිට පතා නොයති.
- න්‍යෂ්ටික පවුල් ක්‍රමයක් වැඩි වශයෙන් සමාජගත වීම මත ප්‍රචණ්ඩත්වය වැඩි වශයෙන් සිදු වේ.

**යෝජනා**

- 2005 අංක 53 දරණ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පනත සම්බන්ධයෙන් පුරුෂයන් දැනුවත් කර දී ප්‍රචණ්ඩත්වය සිදු වන පවුල් සඳහා ප්‍රතිපාදන සලසා දී ඔවුන්ට රැකවරණය සලසා දිය යුතු ය.
- පුරුෂයන් කෙරෙහි පවතින නෛතික රාමුව පවතින දැඩි බවින් මිදී පුරුෂයන් කෙරෙහි නීතියෙන් පවතිනවාට වඩා සහනයක් උදා කර දිය යුතු ය.
- නව නීති පිළිබඳ පොලිස් නිලධාරීන්, නීතිඥයන්, වෛද්‍යවරුන්, ග්‍රාම නිලධාරීවරුන් හා මාධ්‍ය පමණක් නොව සමස්ත ජනතාවම එම නීති පිළිබඳවම නිසි අවබෝධයක් පැවතිය යුතු යැයි ඔවුන්ව දැනුවත් කළ යුතු ය.



ISBN 978-955-627-120-1

- රාජ්‍ය නොවන සංවිධාන මගින් හෝ නීතියේ සරණ නොලැබෙන අවස්ථාවලදී හා නීතියේ දැනුවත්භාවය අවශ්‍ය අවස්ථාවන් සඳහා නීති ආධාර ලබා දීමට කටයුතු කිරීම.
- දිනෙන් දින වන මෙම පුරුෂයන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සමස්ත රටෙහි තිරසාර සංවර්ධනය සඳහා ප්‍රබල බලපෑමක් වන බවට සමාජය දැනුවත් කිරීම.
- පාසල් හැර යන තරුණ කොටස්වලට මෙන් ම විවාහ වීමට සැරසෙන තරුණ පිරිසට උපදේශන වාඩමුළු පවත්වා ජීවිතාවබෝධය ලබා දීම, විවාහය සවිබල කිරීමට සැලැස්වීම.
- ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් ක්‍රියා කරන පුද්ගලයන්ට උපදේශන විෂය අනිවාර්ය කිරීම හා උපදේශනය පිළිබඳව කලත්‍රයන් දැනුවත් කිරීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් එම උපදේශකවරුන් දැනුවත් කිරීම.

## 5. ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


එදිරිසිංහ; අනුෂා, (2007), ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ කාන්තා සාපරාධීත්වය, කතෘ ප්‍රකාශන

එදිරිසිංහ; අනුෂා, (2007), ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, දීපානි ප්‍රකාශන, නුගේගොඩ.

කරුණාරත්න; එම්, ඩබ්ලිව්, (2004), ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්, කාණ්ඩ අංක 2, ප්‍රගතියේ හවුල්කරුවෝ, කොළඹ

ජයසුන්දර; එම්, ඩබ්ලිව්, (2015), සමාජීය විද්‍යා පරියේෂණ ක්‍රම, සාරංගි ප්‍රින්ටර්ස්

නන්දසේන; රත්නපාල,(2013.ස.මු.); සමාජ විද්‍යාපර්යේෂණ මූලධර්ම,කොළඹ 10;ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම

පෙරේරා; ස්වර්ණලතා, (2005);සමාජ ප්‍රශ්න; කොළඹ10;එස්.ඇන්ඩ්.එස්.ප්‍රින්ටර්

සමරකෝන්; මයුර, (2008), නාගරික සමාජ විද්‍යාව

http://ncadv.org./iearan-more/statistic

http://www.wikipedia.org

http://www.researchgate.net

www.samabima.lk




ISBN 978-955-627-128-1